සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**06 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2022(2023) **34 S**

නම: .............................................. **විද්‍යාව** **කාලය පැය දෙකයි**

**I කොටස**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම පිළිතුරකට ම ලකුණු දෙක බැගින් හිමි වේ.
- 1-15 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. රූපයේ දැක්වෙන පියවි ඇසට පැහැදිලිව නොපෙනෙන ඉතා කුඩා ජීවියෙකු වන්නේ,
1. බිං කුණ්ඩා ය.
2. මීයා ය.
3. ඇමීබා ය.
4. මුහුදු මල ය.



02. අවර්ණ හුණු දියර කිරි පැහැයට හරවන වායුව,
1. කාබන්ඩයොක්සයිඩ් වායුව යි. 3. නයිට්‍රජන් වායුව යි.
2. ඔක්සිජන් වායුව යි. 4. හයිඩ්‍රජන් වායුව යි.

03. පාරභාෂක ද්‍රව්‍යයකි,
1. වීදුරු 2. සව් කඩදාසි 3. ලී 4. තාර

04. ප්‍රභාසංශ්ලේෂණය සඳහා ශාක වායුගෝලයෙන් උරාගන්නා වායුව,
1. ඔක්සිජන් වායුව යි 3. හයිඩ්‍රජන් වායුව යි.
2. නයිට්‍රජන් වායුව යි. 4. කාබන්ඩයොක්සයිඩ් වායුව යි.

05. ජලයේ ද්‍රව අවස්ථාවකට උදාහරණයක් වන්නේ,
1. අයිස් ය. 2. හිම ය. 3. ජලය ය. 4. ග්ලැසියර් ය.

06. පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලයෙන් ඝන අවස්ථාවේ පවතින ජල ප්‍රතිශතය දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
1. 0.01% 2. 2.58% 3. 70% 4. 97.41%

ප්‍රශ්න අංක (7) හා (8) සඳහා පහත ආහාර දාමය භාවිතා කරන්න.

ශාකය ⟶ ගොයම් මැස්සා ⟶ ගෙම්බා ⟶ නයා

07. භෝජන ක්‍රමය අනුව ගොයම් මැස්සා අයත් වන කාණ්ඩය වන්නේ,
1. විකා ගිලීම 2. ශාක භක්ෂක 3. සර්ව භක්ෂක 4. යුෂ උරා බොන

08. ඉහත ආහාර දාමයේ යැපෙන්නන් සංඛ්‍යාව,
1. පහකි. 2. තුනකි. 3. දෙකකි. 4. හතරකි.

09. ඇසේ සුද ඉවත් කිරීමටත් හෘද සැත්කම්වල දී සහ ආමාශගත තුවාලවලට ප්‍රතිකාර කිරීමේ දී යොදා ගන්නේ,
1. ලේසර් කිරණ යි. 2.ප්‍රකාශ තන්තු යි. 3. තාප කිරණ යි. 4. ශබ්දය යි.

10. **අසත්‍ය** ප්‍රකාශය මින් කුමක්ද?
1. ස්ථිර ප්‍රතිරෝධකවල අගය වෙනස් කළ නොහැකි වේ.
2. LDR මතට ආලෝකය වැටුණු විට පරිපථය තුළින් අඩු ධාරාවක් ගලා යයි.
3. භාවිතා නොකරන අවස්ථාවල විදුලි පේනු කෙවෙනිවලින් ගලවා තැබිය යුතුය.
4. රිද්මයානුකූල නොවන අවිධිමත් ශබ්ද, ඝෝෂා ලෙස හැඳින්වේ.



LIVEWORKSHEETS

11. වයලීනය මෙන් ශබ්දය උපදවන ධ්වනි ප්‍රභවයකි.
   1. තබ්ලාව   2. තාලම් පට   3. සර්පිනාව   4. සිතාරය

12. පරිපථ සටහනේ දැක්වෙන උපකරණ ඇතුළත් නිවැරදි පිළිතුර කුමක් ද?




1. ස්විච්චය, විද්‍යුත් කෝෂය, වෝල්ට් මීටරය, බල්බය
2. ස්විච්චය , විද්‍යුත් කෝෂය, ඩයෝඩය, බල්බය
3. ස්විච්චය, විද්‍යුත් කෝෂය , ඇමීටරය , බල්බය
4. ඩයෝඩය , බල්බය , ස්විච්චය, ප්‍රතිරෝධකය

13. පහත රූපයෙන් දැක්වෙන උපකරණයෙන් නිරීක්ෂණය කරනු ලබන්නේ,



1. සුළඟේ දිශාව යි.
2. ආර්ද්‍රතාවය යි.
3. සුළඟේ වේගය යි.
4. වායුගෝලයේ උෂ්ණත්වය යි.

14. එක්තරා පදාර්ථයක දක්නට ලැබු ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
- ස්කන්ධයක් ඇත.
- නිශ්චිත හැඩයක් ඇත.
- නිශ්චිත පරිමාවක් ඇත.

ඉහත පදාර්ථය,
   1. වායුවකි.   2. ද්‍රවයකි.   3. ඝනයකි.   4. ද්‍රව හෝ වායුවකි.

15. ඉන්ධන ලෙස භාවිතා කළ හැකි ශාක හා සත්ත්ව ද්‍රව්‍යය පොදුවේ හඳුන්වන නම කුමක්ද?
   1. පොසිල ඉන්ධන   3. න්‍යෂ්ටික ශක්තිය
   2. භූ තාපය   4. ජෛව ස්කන්ධ

ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.
( න්‍යෂ්ටික ශක්තිය, විෂම පෝෂීන්, ෆොසිල ඉන්ධන, ජෛව ස්කන්ධ, වර්ෂණය, මුහුදු මල, ඩොල්ෆින්)

16. ශාක නිපදවන ආහාර මත සතුන් සෘජුවම හෝ වක්‍රව හෝ යැපෙන ජීවීන්.........................................ලෙස හඳුන්වයි.
17. ඔත් ජීවිතයක් ගත කරන ජීවියෙකි.................................................
18. මතුපිට ජලය, භූගත ජලය, ................................ලෙස ජලය පවතින ආකාර වේ.
19. ගල් අඟුරු, පෙට්‍රෝලියම් තෙල්, පෙට්‍රෝලියමේ වායු යන ඒවා........................................වලට අයත් වේ.
20. තාක්ෂණික උපක්‍රම භාවිතයෙන් පරමාණුවලින් ලබා ගන්නා ශක්තිය ........................................... .ලෙස හඳුන්වයි.

## II කොටස

උපදෙස් -
- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. (ලකුණු 16)
- ඉතිරි ප්‍රශ්න 6 න් ඔබ කැමති ප්‍රශ්න 4 ට පමණක් පිළිතුරු ලියන්න. ( ලකුණු 11X4 = 44)
- පිළිතුරු ලිවීම සඳහා වෙනම කඩදාසියක් භාවිතා කරන්න.

01) (A) ජෛව ලෝකයේ අසිරිය පාඩමට 6 ශ්‍රේණියේ ළමුන් තම විද්‍යාව ගුරුතුමිය සමඟ ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය.
   (i) ක්ෂේත්‍ර චාරිකාව යාමට පෙර ගුරුතුමිය විසින් ලබා දෙන උපදෙසක් ලියන්න. (ලකුණු 01)
   (ii) ක්ෂේත්‍ර චාරිකාවේ දී සිසුන් විසින් ගෙන යායුතු උපකරණයක් හා එයින් ඇති ප්‍රයෝජනයක් ලියන්න. ලකුණු 02)
   (iii) චාරිකාවේ දී මකුළු දැලක පැටලුණු සමනලයෙකු සහ ඒ වෙත පැමිණෙන මකුළුවෙකු සිසුන්ට නිරීක්ෂණය විය. මෙම නිරීක්ෂණ පදනම් කරගෙන පුරුක් තුනක ආහාර දාමයක් ලියන්න. ( ලකුණු (02)
   (iv) පොකුණු පරිසරයක දක්නට ලැබෙන ජලජ ශාකයක් නම් කරන්න. (ලකුණු 01)



LIVEWORKSHEETS